# ECHO OF HIS CALL

## කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

50 ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVIII YEAR OF OUR LORD JESUS CHRIST, 2024 JUNE Issue No. 07


### ශුද්ධවූ බයිබලය

**(හිතෝපදේශ 21:1 - 10)**

01. රජුගේ සිත දිය පාරවල් මෙන් ස්වාමීන්වහන්සේගේ අතෙහි පවතී; උන්වහන්සේ කැමැති අතකට ඒක හරවනසේක.

02. මනුෂ්‍යයෙකුගේ සියලු මාර්ග තමාගේම ඇසට හරිව පෙනෙයි; එහෙත් ස්වාමීන්වහන්සේ සිත් කිරා බලනසේක.

03. පූජාවට වඩා ධර්මිෂ්ඨකමද යුක්තියද කිරීම ස්වාමීන්වහන්සේට ප්‍රියව තිබේ.

04. අහංකාර බැල්මද උඩඟුරු සිතද යන දුෂ්ටයන්ගේ පහන පාපයය.

05. කඩිසර අයගේ යෝජනාවලින් ලාභම ලැබේ; එහෙත් ඉක්මන්කාරයා ඉක්මන්වෙන්නේ හිඟවීමට පමණකි.

06. බොරුකාර දිවකින් වස්තු ලබාගැන්ම හුළඟට ගසාගනයන දුමාරයක්ය; ඒවා මරණයේ මලපත්ය.

07. දුෂ්ටයෝ යුක්තිය කිරීමට අකමැති නිසා තමුන්ගේ බලාත්කාරකමෙන් බැහැර කරනු ලබන්නෝය.

08. වරදෙන් බරවූ අයගේ මාර්ගය ඉතා ඇදය; එහෙත් පිරිසිදු අයගේ ක්‍රියාව සෘජුය.

09. ඩබරකාර ස්ත්‍රියෙකු සමඟ පොදු ගෙයක සිටීමට වඩා පියස්සේ මුල්ලක ඉඳීම හොඳය.

10. දුෂ්ටයාගේ ආත්මය නපුරට ආශාවන්නේය; ඔහුගේ අසල්වාසියාට ඔහුගේ ඇස් හමුයෙහි කරුණාව නොලැබේ

## ස්වාමීන්වහන්සේට ඔබව අවශ්‍යයි !

## THE LORD NEEDS YOU!

**ප්‍රධාන කර්තෘ ඇන්ජලීන් සෙල්ව කුමාරි**

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සාමාජිකයන් සෑම දෙනාටම මාගේ සුභ පැතුම් ගේනෙමි



2024 වන වර්ෂයේ මුල් කාර්තුව මෙපමන ඉක්මනින් ගෙවී ගිය ආකාරය සිතා ගැනීමටවත් නොහැක. කාලය ඉතාම වේගයෙන් ගෙවී යයි. මේ නිසා දේව වචනය පවසන ආකාරයට, ''අප ඥානවන්ත. ලෙස අපගේ කාලය පාවිච්චි කරමින් කාලය නපුරු බැවින් ප්‍රස්ථාව අල්ලාගන්නය'' කියාය. ***(එපීස 5:16)*** අපගේ ජීවිත කාලය ගැන දන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පමණි. එසේම උන්වහන්සේ මේ ලෝකයට පැමිණෙන අරමුණ ප්‍රකාශ කල යුත්තේ කුමන කාලයේදීද කියා උන්වහන්සේ දනී.

මාර්ක් 11 වන පරිච්ජේදයෙහි සඳහන් වී ඇති පරිදි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යෙරුසෙලමට ඇතුලු වීම ඉතාම වැදගත්වූ සිද්ධියක් වෙයි. එහෙත් යේසුස් වහන්සේ ප්‍රසිද්ධියේ තමා මෙසායා කියා ප්‍රකාශ කලේ නැත. නමුත් උන්වහන්සේ කොටළුවා පිට නැගී යෙරුසෙලමට ඇතුල්වන විට දී උන්වහන්සේ ''මෙසායා'' කියා ප්‍රසිද්ධියේම කියන ලදි. මෙලෙස සෙකරියා 9:9 හි සඳහන්කර ඇති ආකාරයට උන්වහන්සේ ප්‍රකාශ කල අනාවැකිය ඉෂ්ඨ විය.

*3 වෙනි පිටුවට ...*




**Echo of His Call**

*Christian YouTube Channel!*

**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Message & Prayer in 5 minutes!!

**English, Hindi, Tamil & Telugu**

Every day – From 2.00 A.M.


**Tamil Sunday Service – 8.30 A.M.**

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

# from your dearly beloved brother...

REACHING NATIONS





## OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
HON. MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Sis. L. Mariya Anjalin, M.A., M.Sc., B.Ed.
Rev. Dr. K.R. Rajasekaran
EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

**"ස්වාමීන්ගේ මහිමය සදාකල් පවතීවා. ස්වාමීන්වහන්සේ ස්වකීය කර්මාන්ත කෙරෙහි සන්තෝෂවන සේක්වා."**
**(ගීතාවලිය 104:31)**

**ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රිය මිත්‍රවරුනි,**

අපගේ ස්වාමීවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අනර්ඝවූ නාමයෙන් අප ඔබට සුභ පතමි !

ඔබ දන්නා පරිදි චේපාක් වල තිබෙන නෙහෙමියා බයිබල් විදුහල (දමිළ භාෂාවෙන්) සංදෝෂපුරම් (දමිළ භාෂාවෙන්) හා වේලච්චේරි (හින්දි භාෂාවෙන්) පවත්වාගෙන යන්නාවූ බයිබල් විදුහල් වල ඉගැන්වීි 2024 ජූනි මස 3 වන දින නැවත ආරම්භ කිරීම පිණිස අප ඉතා කාර්‍යක්ෂම ලෙස ක්‍රියා කරමින් සිටිමුව. එසේම 2024 වර්ෂයේ ජූනි මස පළමු වන දින බයිබල් විදුහලේ ඉගෙනීම අවසන් කළ ශිෂ්‍යයින්ගේ උපාධි පිරිනැමීමේ උත්සවය පවත්වන අතර එම උත්සවයෙන් අනතුරුව කිසිදු සභාවක් නොමැති ස්ථාන වල මිෂනාරී සේවය ආරම්භ කිරීම පිණිස මෙම ශිෂ්‍යයින් පිටත් වෙයි. මේ උදෙසා විශේෂයෙන් යාච්ඤා කරන්න.

නෙහෙමියා බයිබල් විදුහලේ හින්දි භාෂාවෙන් දේව වචනය ඉගෙන්වීමට අවශ්‍ය කථිකාචාර්‍යවරු M. Div, M. Th, උපාදි ලබා තිබෙන්නාවූ අය අවශ්‍යව ඇත. එසේම හින්දි භාෂාවෙන් ඉගෙන ගන්නාවූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ද අපට අවශ්‍යව ඇත.

ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් කිතුණු පාසලේ ඉංග්‍රීසි භාෂාවෙන් ඉගෙන ගැනීමට අවශ්‍ය ශිෂ්‍යයින් ලබා දෙන්නය කියාද යාච්ඤා කරන්න. තවද ශුභාරංචිය නොගියාවූ සෑම පලාත්වලටම ගොස් සභාවන් රෝපනය කිරීමටත් සේවය කිරීමටත් බොහෝ අය අපට අවශ්‍ය නිසා ඒ ගැනද යාච්ඤා කරන්න. උපකාර කරන්න.

අප යම් යම් ආත්මික සටන් තුළින් ගමන් කරන නිසා ඒ ගැනද යාච්ඤා කරන්න. අපගේ බොහෝ සේවකයින්ගේ පවුල්වල සාමාජිකයන්ගෙන් සමහරු දරුණු රෝග වලින් පහර ලබා ඇති නිසා මෙය සේවාවන් වලට බොහෝ බාධාවක් වී ඇත. ඒ නිසා ඔවුන්ගේ දිව්‍යමය සුවය උදෙසා යාච්ඤා කරන්න.


ඔබගේ ත්‍යාගශීලී දීමනා තුළින්ද යාච්ඤා තුළින්ද අපව දරාගන්න. අප බොහෝ ආර්ථික ප්‍රශ්න වලට මුහුණ දෙනු ලබන නිසා අපගේ සේවයෙහි යෙදී සිටිනානාවූ අයට යවන්නාවූ උපකාරයන් සහ දීමනාවන් යැවීමට ප්‍රමාද වී තිබේ. එබැවින් අප ස්වාමීන්වහන්සේ දෙස බලා සිටිමු. අප ඔබ උදෙසාද යාච්ඤා කරමු.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

*Pr. Alex Samson Sam*
*Pr. S. Sam Selva Raj*

(+91) 98412 71858 / 98410 71858, E.mail : sam@echoofhiscall.org

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ✪ BIBLECOR - Postal Courses (3 languages) ✪ YouTube Ministry ✪ Online Courses ✪ Theological Correspondence Courses (2 languages) ✪ Church Planting ✪ Nehemiah Bible Colleges ✪ Gospel Printing Press ✪ Great Commission Partners ✪ St. Paul's Matriculation School ✪ Crusades ✪ Community Development




Hosanna in the highest!

***''ඔව්හු කොටළු වස්සා යේසුස් වහන්සේ ළඟට ගෙනැවිත් තමුන්ගේ වස්ත්‍ර ඌ පිට ලූවෝය. උන්වහන්සේ ඌ පිට හිඳගත්සේක. එවිට බොහෝ දෙනෙක් තමුන්ගේ වස්ත්‍රද තවත් අය කෙත්වලින් කපාගත් අතුද මග ඇතුළෝය.'' (මාර්ක් 11:7 - 8)***

යෙරුසෙලමේදී උන්වහන්සේ තමාට සිදුවෙන්නේ කුමක්ද කියා දැන සිටියෝය. එම ගමන යාමට සුදුසුම වෙලාව එයයි කියා දැන සිටිය නිසාය. සෙනඟගේ ප්‍රශංසාව, ගායනය හා ප්‍රීති ඝෝෂා මැද උන්වහන්සේ යෙරුසෙලමට ඇතුල වූවත් දින කිහිපයනට පසුව උන්වහන්සේට වද වේදනා දෙන බවත්, උන්වහන්සේට කෙළ ගසන බවත් උන්වහන්සේට කවටකම් කරමින් කුරුසිපත් කරන බවත් උන්වහන්සේ දැන සිටියේය. උන්වහන්සේගේ කුරුසිපත් වීම හා මරණය සියලුම පරම්පරා වලට ආශිර්වාදයක් වන බව උන්වහන්සේ දැන සිටියේය. තවද උන්වහන්සේගේ පූජාව කරණකොට මුළු මිනිස් සමාජයටම මිදීම ගෙන දුන්නේය.

මාර්ක් 11 වන පරිච්ඡේදය කියවන විටදී එහි තිබූ කොටස් 3 කට මාගේ අවධානය යොමු විය.

***''තුඹලා ඉදිරි පිට තිබෙන ගමට පලයල්ලා එහි ඇතුල්වූ කෙනෙහිම කිසි මනුෂ්‍යයෙක් නොනැඟුන කොටළු වස්සෙකු බැඳ සිටිනවා තුඹලාට සම්බවන්නේය. ඌ ලිහා ගෙනෙල්ලා.'' (මාර්ක් 11:2)***



Disciples found a colt tied!

1. **සොයාගන්න !**
2. **ලිහාගන්න !**
3. **ගෙනෙන්න !**

## 1. සොයාගන්න

යේසුස් වහන්සේ කොටළුවෙක්ව සොයාගෙන එන්න කියා උන්වහන්සේගේ ගෝලයින් දෙදෙනෙකු යැවීය. කොටළුවාව සමාදානයට සමාන කරයි. සාලමොන් රජතුමා යුද්ධය සඳහා මිසරයෙන් අශ්වයින් ගෙනාවේය. නමුත් කොටළුවා යටහත් පහත්වූ සතෙකි. තවද කොටළුවා විශාල බරක් වුවද ගෙනයාමට හැකි සතෙකි. එසේම බොහෝ යුදාවරුන් ඔවුන්ගේ ගොවිතැන් කටයුතුවලට හා අනෙකුත් බර වැඩ වලට පාවිච්චි කරනු ලැබූයේ කොටළුවන්වය.

යේසුස් වහන්සේ තම ගෝලයින්ට අණක් දෙමින් ගොස් කොටළුවෙක්ව සොයගෙන එන්න කියා පවසනු ලැබීය.

තවමත් දෙවියන්වහන්සේ කොටළුවන්ව සොයයි. (ඔබයි/මමයි). උන්වහන්සේගේ වචනය සහ උන්වහන්සේගේ අරමුණ උසුලාගෙන යා හැකි කිසියම් කෙනෙක්ව උන්වහන්සේ සොයමින් සිටී. ස්වාමීන්වහන්සේ විසින් පාවිච්චි කිරීමට හැකි තමාගේ කාල වේලාව කැප කරන්නාවූ තමාගේ කැමැත්ත ප්‍රකාශ කරන්නාවූ ඕනෑම වේලාවක සූදානමින් සිටින්නාවූ අයව උන්වහන්සේ සොයමින් සිටී.

ගෝලයින් කොටළුවාව සොයාගෙන ගිය විටදී ඔවුන් කොටළුවෙක්ව සොයා ගත්තේය.

දොර ළඟ බැඳ සිටි කොටළුවා

මාවත් දෙකක් අතර සිටී කොටළුවා

2024 වන වර්ෂයෙහි ජීවත් වෙන්නාවූ අපි ඉතාම කාර්ය බහුල වී ඇත. අපගේ අධික වැඩ වලින් අපව බැඳ තිබේ. ඔබගෙන් යමක් ඔබ බයිබල් පාඩම්මාලාවට ආවේ නැත්තේ ඇයි? කියා ඇසූ විට අප දෙන පිළිතුර නම්, ''මා ඉතා වැඩ අධික වූ නිසා මහන්සියක් දැනුනා'' පසුගිය සතියේ ඔබ ඉරුදින දේව මෙහෙය තුල මා දුටුවේ නැහැ කියා ඇසූ විට, ඔබ දෙන පිළිතුරනම්, ''සමාවෙන්න පාස්ටර්, මගේ මගේ පුද්ගලික හා පවුලේ කාර්‍යයන්ට මා බැඳී සිටි නිසා මට එදින එන්නට බැරි වුනා.'' කියා පිළිතුරු දෙයි. නමස්කාර පුහුණුවට ඔබ ආවේ නැත්තේ ඇයි? කියා ඔබගෙන් ඇසූ විට ''සමාවෙන්න, මා වැඩ කරන්නාවූ ස්ථානයෙහි බොහෝ රාජකාරී වලට මා බැඳී සිටින නිසා මට එතනින් එළියට එන්න අපහසු වුනා'' කියා පවසයි. අද බොහෝ දෙනෙකුගෙන් අසන්නාවූ ප්‍රශ්න වලට ඔවුන් දෙන්නාවූ පිළිතුරු නම් මේවාය. මාව වරදවා වටහා නොගන්න. අපගේ සියලු වැඩ රාජකාරී අපට වැදගත් නමුත් අප එක් දෙයක් තේරුම් ගැනීමට අවශ්‍ය වෙයි. එනම් විශේෂයෙන් අප මුදල් උපයාගන්න පිණිස යක්ෂයා අපව ඉතා කාර්‍යය බහුල කර අපව ඒවාටම බැඳ තබාගන්නේ කෙසේද කියාය.

අද බොහෝ මනුෂ්‍යයන් සිතන්නාවූ කාරණයක් නම්, වැඩියෙන් උපයා ගත්තොත් වැඩියෙන් ඉතිරි කරන්න

පුළුවන් කියාය. 'නැත' මෙහි කිසිම සත්‍යතාවයක් නැත. අද බොහෝ හම්බකලත් අපට බොහෝ වියදම් ඇත. සමහරු ඔවුන්ට තිබෙන ණය ගෙවාගන්නා පිණිස වැඩි වේලාවක් වැඩ කරති. එම නිසා ඔවුන්ට අනෙකුත් දේ භුක්ති විඳීමට අමාරු වී තිබේ.

අද උන්වහන්සේ සොයන්නේ උන්වහන්සේව උසුලාගෙන යාමට හැකි අයවයි. නමුත් අද උන්වහ්සේ දකින්නේ, උන්වහන්සේ සෙතඟ උන්වහන්සේට දිය යුතු කාලය නොදී බොහෝ කාර්ය බහුල තත්වයට පත් වී, ගෙවල් සෑදීම, ගොඩනැගිලි ඉදි කිරීම හා ඔවුන්ගේ ව්‍යාපාරයන් දියුණු කිරීම වැනි දේ වලට යෙදී සිටීමයි.

අප කාර්යය බහුලයි යන්නෙන් අදහස් වන්නේ යක්ෂයාගේ වියගහඅප පිට තිබෙන නිසාය. ඉංග්‍රීසි භාෂාවෙන් Busy යන්නෙහි තේරුම ඔබ දන්නවාද? එහි

**B → Being**
**U → Under the**
**S → Satan's**
**Y → Yoke**

එක් එක් අකුර දෙස බැලූ විටදී එහි තේරුම වන්නේ 'සාතන්ගේ වියගහ යටතේ සිටිනවා' කියාය. මේ හේතු කාරණාවන් නිසා යාච්ඤා කිරීමට, දේව වචනය කියවීමට, සහභාගීකම් පැවැත්වීමට හා දේවස්ථානයට යාමට අපට වේලාවක් නැතිව සිටී. යක්ෂයාගේ වියගහ යටතේ ඔබ සිටිනවා නම්, එය ඔබට ඉතාම බරකි. එසේම ඔබ තවත් කෙනෙකුටද බරකි. නමුත් ඔබ අපගේ ගැලවුම්කරුවාණන්ගේ වියගහ දරා ගන්නවා නම්, එය ඉතාම පහසු වෙයි.

*''වෙහෙසවෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි, මා වෙතට වරෙල්ලා, මම නුඹලාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටහත්ව සිටින බැවින් මාගේ වියගහ නුඹලා පිටට ගෙන, මාගෙන් ඉගෙනගනිල්ලා. එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය. මක්නිසාද මාගේ වියගහ පහසුය. මාගේ බරද සැහැල්ලුය.'' (මතෙව් 11:28 - 30)*



**Jesus Christ cares for you!**

අප අපගේ ගැලවුම්කාරයාගේ වියගහ යටතේ නොසිටින්නේ නම්, අප සිටින්නේ යක්ෂයාගේ වියගහ යටතේය. අප සාතන්ගේ වියගහ යටතේ සිටින විට, අපගේ පවුල සමඟ කාලය ගත කිරීමට අපට වේලාවක් නැත. ස්වාමීන්වහන්සේ සමඟ තිබෙන්නාවූ පුද්ගලික සම්බන්ධතාවය නැතිවෙයි. සේවයට තිබෙන්නාවූ කැපවීම නැති වෙයි. අද අප ජීවත්වෙනු ලබන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්ත හා උන්වහන්සේගේ සැලැස්මෙන් පිටතය. අපි නිවැරදි තීරණයකට පැමිණිය යුතු අවස්ථාව නම්, මෙයයි.

තවද ඔබත් මාර්ගයන් දෙකක් අතර හිරවී කැළඹීමට පත්වී සිටින්නාවූ කෙනෙක් වීමට හැකිය. ඔබ තෝරාගත යුත්තේ කුමන පැත්තද කියා ඔබට තෝරා ගැනීමට නොහැකිව සිටිනවා විය හැකිය. ඔබ ස්වාමීන්වහන්සේගේ දෑතට භාර වෙන්න. උන්වහන්සේ ඔබ වෙනුවෙන් කල්වාරි කුරුසියේදී ජීවිතය පූජා කලා. ඔබට පැමිණෙන්නාවූ සෑම වේදනා, පරාජයන්, ශාප හා දඬුවම් යන සියල්ලම උන්වහන්සේ පිටට ගත්තේය. ඔබගේ මාවත ස්ථිරව කරමින් ඔබව නිවැරදි වූ මාවතක ඉතා පැහැදිලිව ගෙන යාමට උන්වහන්සේට පුළුවනි.

සමහර විට ඔබට මෙසේ පැවසීමට පුළුවනි. එනම්, ''ඔබ දන්නවාද මගේ කුඩා කාලයේ සිටම මා දෙවියන්වහන්සේට සේවය කලා. අද මට වෙලා තියෙන්නේ මොනවාද? කියා බලන්න. එම නිසා මා දෙවියන්වහන්සේට ලංවීමට කැමති නැහැ. මා දෙවියන්වහන්සේට ලංවීමට වඩා ඈත් වී ජීවත් වෙන එක මට හොඳයි කියාත් අපට ලෝකය සහ දෙවියන්වහන්සේ යන දෙකම ඕනි නිසා මා දෙයවින්වහන්සේට පොඩ්ඩක් ඈතින් ගමන් කිරීමට ඕනි'' කියාය.



***Peter followed him at a distance***

ඔබ දෙවියන්වහන්සේට ඈතින් ගමන් කරනවාය කියා පැවසීම ඉතාම භයානක වූ දෙයකි. මන්ද ඔබ දෙවියන්වහන්සේගෙන් ඈතින් ගමන් කරනවා නම්, ඔබ ඉක්මනින්ම දෙවියන්වහන්සේගෙන් සම්පූර්ණයෙන්ම ඈත් වී යනු ඇත. ඔබ ඔබගේ ඇදහිල්ලත් පාවා දෙනු ඇත. පේතෘස් යේසුස් වහන්සේගෙන් ඈත් වී ගමන් කල ආකාරය ඔබ දනී. ***''නුමුත් පේතෘස් උත්තම පූජකයාගේ ශාලාව දක්වා උන්වහන්සේ අනුව දුරින් ගොස් ඇතුළුව...'' (මතෙව් 26:58)***

ඈතින් ගමන් කරන විටදී ඔබ වැටෙයි. යේසුස් වහන්සේ අද ඔබට පවසන්නේ ඔබ දෙසිතක් ඇතිව

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ජූනි:19-** 1969 වන වර්ෂයේ සිට මෙම සඟරා සේවයට ලැබුන ආශිර්වාද නිසා ස්තුති කරන්න.

**ජූනි:20-** නෙහෙමියා බයිබල් විද්‍යුහලේ සවස්කාලීනව පවත්වාගෙන යනු ලබන බයිබල් පාඩම් මාලාව නිසා ස්තුති කරන්න.

**ජූනි:21-** 2024 වසරේ ජූනි 1 වන දින පැවැත්වූ නෙහෙමියා බයිබල් විදුහල උපාධි පිරිනැමීමේ උත්සවය නිසා ස්තුති කරන්න.

**ජූනි:22**- 2023 - 2024 යන වර්ෂය තුළදී නෙහෙමියා බයිබල් දදුහල සහ ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසලේ පවත්වාගෙන පැමිණි පාඩම් මාලාව ඉතා සාර්ථක ලෙස නිමා කිරීමට දුන් කරුණාව නිසා ස්තුති කරන්න.

**ජූනි:23-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ YouTube හරහා ලබා දෙන දේව වචනයේ පණිවිඩය දෙමළ, තෙලිඟු, ඉංග්‍රීසි හා හින්දි භාෂාවන්ගෙන් ඉදිරියට පවත්වාගෙන යාමට දුන් කරුණාව නිසා ස්තුති කරන්න.

**ජූනි:24-** අපගේ ප්‍රධාන සභාවේ හා ශාඛා සභාවන් වල පැවැත්වූ නිවාඩු කාලීන බයිබල් පාසලේ පාඩම් මාලාවන් සාර්ථකව පැවැත්වූ නිසා ස්තුති කරන්න.

**ජූනි:25-** අපගේ යාච්ඤා පාඨකයින් සහ උදවු උපකාර කරන්නාවූ ඇදහිල්ලේ පංගුකාරයින් සියලු දෙනා උදෙසා අපි දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**ජූනි:26-** ගෝලීය තරුණ සේවය හා ළමා සේවය උදෙසා දිනපතා උදෑසන 10.00 ට අපි දෙවියන්වහන්සේට ස්තුති කරමු.

**ජූනි:27-** මෙතරම් දුරක් අපගේ සංවිධානය ආශිර්වාදලත් ගමනක් පැමිණි නිසා දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**ජූනි::28-** යාච්ඤාවෙන් හා මූල්‍යමය අතින් අපට උපකාර කරන්නාවූ සෑම දෙනා උදෙසාම යාච්ඤා කරන්න.

**ජූනි:29-** 2024 වසරේ මැයි මස 13 වන දින පැවැත්වූ නෙහෙමියා බයිබල් විදුහලේ ආදී ශිෂ්‍ය එකමුතුව නිසා ස්තුති කරමු.

**ජූනි:30-** අපගේ ප්‍රධාන පාලකතුමා සහ ඔහුගේ පවුලේ සෑම සාමාජිකයෙක්ම සියලු අන්ධකාර බලවේග වලින් ආරක්ෂා කරන නිසා ස්තුති කරන්න.

**ජූලි:01-** අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවට උපකාර කරන්නාවූ උප කර්තෘ වරුන් නිසා ස්තුති කරන්න.

**ජූලි:02-** ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසල, නෙහෙමියා බයිබල් විදුහල, තැපැල් මාර්ගික බයිබල් පාඩම් සියල්ලටම ලබා දුන් දේව ආශීර්වාදය නිසා ස්තුති කරන්න.

**ජූලි:03-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ කාරක මඩුල්ල සහ ඔහුගේ පවුල නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජූලි:04-** අපගේ සේවාවන්ට කැපවූ සේවකයින් ලබා දෙන්නය කියා දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න.

**ජූලි:05-** නිවාඩු කාලීන බයිබල් පාඩම් තුළින් ගැලවීම ලැබූ තරුණ තරුණියන් නිසා යාච්ඤා කරන්න.

**ජූලි:06-** 2024 - 2025 යන වර්ෂය සඳහා නෙහෙමියා බයිබල් විදුහලට අලුතින් ඇතුලු වූ ශිෂ්‍යයින් නිසා යාච්ඤා කරන්න.

**ජූලි:07-** ශුභාරංචිය නොගියාවූ ප්‍රදේශ වල ශුභාරංචිය ප්‍රකාශ කරමින් මිශනාරී සේවයෙහි යෙදී සිටින්නාවූ සියලු දෙනා උදෙසා යාච්ඤා කරන්න.

**ජූලි:08-** අපගේ කාර්යාලයේ සේවක මඩුල්ල, මුද්‍රණාලයේ සේවක මඩුල්ල උදෙසාත් ඔවුන්ට ඉතා හොඳ ශාරීරික සුවය උදෙසාත් යාච්ඤා කරන්න.

**ජූලි:09-** මෙම මාසයේදී අපගේ සියලු වියදම් දෙවියන්වහන්සේ සපයන්න කියා යාච්ඤා කරන්න.

**ජූලි:10-** දුක් විඳින්නාවූ ජනතාවගේ ආර්ථික තත්වය දෙවියන්වහන්සේ ඔසවන්න කියා යාච්ඤා කරන්න.

**ජූලි:11-** ලෝකයේ සෑම රටකම දේව භය ඇති නායකයින් නැගිටුවන්න කියා යාච්ඤා කරන්න.

**ජූලි:12-** ඉන්දියාවෙහි ශුභාරංචිය නොඇසූ ස්ථාන වලට ශුභාරංචි පණිවිඩය යන පිණිස යාච්ඤා කරන්න.

**ජූලි:13-** මුළු ලෝ තලයෙහිම දෙවියන්වහන්සේගේ සමාදානය ඇතිවෙන්නය කියා යාච්ඤා කරන්න.

**ජූලි:14-** අපගේ ප්‍රධාන පාලක තුමාගේ ජීවිත කථා පොත එළිදැක්ම උදෙසා යාච්ඤා කරන්න.

**ජූලි:15-** අපගේ සේවාවන් ව්‍යාප්ත වන පිණිසත් මුළු ලෝ තලයෙහිම ශුභාරංචිය ප්‍රකාශ වන පිණිසත් යාච්ඤා කරන්න.


**ජූලි:16-** අපගේ ප්‍රධාන පාලක සෑම් සෙල්ව රාජ් සහ ඔහුගේ පවුලේ නිරෝගීමත් ජීවිතය උසො යාච්ඤා කරන්න.

**ජූලි:17-** මුළු ලෝ තලයෙහිම සිටින්නාවූ සියලුම ශුභාරංචි සේවයෙහි යෙදී සිටින සියලු දෙනාගේම ආරක්ෂාව උදෙසා යාච්ඤා කරන්න.

**ජූලි:18-** 2024 - 2025 යන වර්ෂය සඳහා ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලට අලුතින් ඇතුලු වූ ශිෂ්‍යයින් නිසා යාච්ඤා කරන්න.

....Contd. from page 4

සිටිනවා නම්, මාවත් දෙකක් අතර සිරවී සිටිනවා නම්, උන්වහන්සේ පවසන්නේ, ''මා ඔබ ගැන බලා සිටිනවාය'' කියාය. ඔබ ඇතින් යන ගමන නතර කරමින් උන්වහන්සේගේ ආරාධනාව පිළිගෙන උන්වහන්සේට ළංව ගමන් කිරීමට ඔබ සූදානම්ද?



## 2). ලිහා ගන්න


ගෝලයින් කොටළුවාව සොයාගෙන ගිය විටදී මෙම කොටළුවා මාර්ග දෙකක් අතර බැඳ තිබූ ආකාරය දුටුවේය.

අපගේ දෙවියන්වහන්සේ ඉතා යහපත් වූ ස්වාමීන්වහන්සේයි. උන්වහන්සේ කිසිවෙකුටවත් බල කරන්නේ නැත. අකීකරු පුත්‍රයා නැවත එනතුරු පෙරමග බලා සිටි පියා ලෙස යේසුස් වහන්සේ අපටද බොහෝ ලෙස ප්‍රේම කරමින් අප උන්වහන්සේ වෙතට එන තුරු අප දෙස බලා සිටී. අපගේ ස්වර්ගීය පියාණෝ ඔබ වෙනුවෙන් අදත් බලා සිටී.

ඔබව බැඳ තිබෙන්නාවූ නොයෙකුත් බැඳුම් වලින් උන්වහන්සේ ඔබව නිදහස් කර උන්වහන්සේගේ කැමැත්ත තුලට ගෙන යන පිණිස දෙවියන්වහන්සේ බලා සිටී. අප අතර සිටින බොහෝ දෙනෙක් ඔවුන්ගේ බැඳුම් වලින් ලිහනවාට කැමති නැත. ''ස්වාමීනී, ඔබගේ කැමැත්ත වේවා'' කියා අප යාච්ඤා කල නමුත් අප අපගේ හදවත තුළින් පවසනුයේ, ''ස්වාමීනී, මගේ හදවතෙහි තිබෙන කැමැත්ත ඉෂ්ඨ කරන්න'' ය කියාය. දෙවියන්වහන්සේගේ කැමැත්ත නම්, උන්වහන්සේ අ උදෙසා තබා තිබෙන්නාවූ සැලැසුම් ඉෂ්ඨ කරන්නටත් ඒ සැලසුම් කෙරෙහි අප ගමන් කරනු ලැබීමටත්ය. නමුත් අප අපගේ සැලසුම් ක්‍රියාත්මක කිරීමට වෑයම් දක්වති.

ඔබ දෙවියන්වහන්සේට සේවයක් කරමින් උන්වහන්සේ ප්‍රිය කරන්නාවූ ජීවිතයක් ගත කරන්න. නමුත් අද ඔබව ලණුවකින් ගැටගසා තිබේ. ඔබ ඔබගේ කැඩුණාවූ මනසින් එළියට ඒමට නොහැකිව සිටිනවා විය හැක. දෙවියන්වහන්සේ ඔබගේ හදවත දකී. මනුෂ්‍යයන් ඔබගේ සිනහව පමණක් දකින නමුත් ඔබ ඇතුලාන්තයෙන් හෙලන්නාවූ කඳුළු ඔබ ගමන් කරනු ලබන්නාවූ අඳුරු රාත්‍රියන් කිසිවෙක් දකින්නේ නැත.

ස්වාමීන්වහන්සේ මේවායින් ඔබව නිදහස් කිරීමට කැමතියි. ඔබට ඉදිරියට යාමට නොහැකිව ඔබව හිරකර තිබෙන්නාවූ දේ වලින්ද නිදහසක් නොමැතිව තිබෙන්නාවූ දේ වලින්ද නිදහසක් නොමැතිව තිබෙන්නාවූ බැඳුම් වලින්ද නිදහස් කරමින් ඔබව දියුණුවට පත් කිරීමට



God knows your tears!

දෙවියන්වහන්සේ බලා සිටී. ඔබ යේසුස් වහන්සේ වෙතට හැරෙන්න. මෙය ඔබගේ අවස්ථාවයි. දෙවියන්වහන්සේ ඔබව නිදහස් කරන බව තේරුම් ගන්න. ඔබගේ ගමනේදී ඔබ නිදහස් වූ පුද්ගලයෙක් හැටියට යේසුස් වහන්සේ සමඟ ගමන් කරන්න.

## බාලාම් සහ බාලාක්

ගණන් කථාව 22 වන පරිච්ඡේදයෙහි අනාගතවක්තෘ බාලාම් ගැන සඳහන් කරයි. ඔහුට ආශිර්වාද කිරීමටද බලය තිබුණි. ඉශ්‍රායෙල් සෙනඟට ශාප කරන පිණිස මෝවබ්හි රජතුමා බාලාම්ගෙන් තුන්වතාවක්ම ඉල්ලීමක් කරනු ලැබුවා. පටන්ගැන්මේ සිට එය දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවෙයි කියා බාලාම් දැනගෙන සිටියේය. නමුත් ඔහු මෙම කොටළුවා මෙන් පාරවල් දෙකක් අතර සිටියේය. මුදල්, ජනප්‍රියකම, තනතුරු, බලය, හා අන් අයගේ අවධානය ලබා ගැනීම යන මේ සියල්ලෙන්ම හිරවී දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට බැරිය කියන ස්ථානයෙහි සිටියේය.



King of Moab requested Balaam to curse the Israelites.

ඔබත් බාලාම් මෙන් දෙසිතක් ඇතිව සිටිනවා නම්, බාලාම් වෙතට දෙවියන්වහන්සේගේ දූතයා පැමිණ ගමන බාධා කලාක් මෙන් ඔබගේ මාර්ගය ඔබ වෙනස් නොකරන්නේ නම්, දෙවියන්වහන්සේ ඔබගේ මාර්ගයට බාධාවක් ගෙනෙයි. උන්වහන්සේගේ කඩුවද ඔබට විරුද්ධව ඔසවයි.

දෙවියන්වහන්සේ ඔබව ලිහා නිදහස් කිරීමට කැමතියි. නමුත් ප්‍රශ්නය නම්, ඔබට නිදහස් වීමට කැමතිද?

## 3). ගෙනෙන්න

දෙවියන්වහන්සේ ඔබව ලිහා නිදහස් කර උන්වහන්සේ වෙතට නැවත ගෙනෙන්නට බලා සිටී. ඔබව උන්වහන්සේ වෙතට ගෙනෙන්නට ඔබ ශුද්ධවන්තයෙක් වීමට අවශ්‍ය නැත. ඔබ සිටින්නාවූ ආකාරයෙන්ම ස්වාමීන්වහන්සේ වෙතට එන්න. ඔබගේ වේදනාව, අධෛර්යකම්, එපාවීම්, තරහාව, පරාජිතභාවය, තනිකම ආදී මේ සියල්ලම සමගම උන්වහන්සේ වෙතට එන්න. යේසුස් වහන්සේ ඔබගේ සටන් හා ඔබගේ අමාරුකම් දනී.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබ මුහුණ දෙනු ලබන්නාවූ සෑම ආමරුකමක් ගැනම සානුකම්පිතව බලයි. උන්වහන්සේගේ ජීවිතයේ අවසාන කාලයේදී උන්වහන්සේ මිනිසුන් සමූහයක් වටකරගෙන සිටියද ගෙත්සෙමෙනි උයනේදී උන්වහන්සේ මහත් තනිකමක් අත් දුටුවේය.

ඔබට ධනය, බලය හා කීර්තිය ලබා ගත හැකි නමුත් ඔබ තවමත් තනිකම සමග පොරබදනවා විය හැක. දෙවියන්වහන්සේට ඔබගේ තනිකමේ ගැඹුර තේරුම්ගත හැක.

දෙවියන්වහන්සේ ඔබව සොයමින් සිටී. ඔබ කැඩී බිඳී, නින්දාවට හා පරාජයට පත් වී සිටිය හැක මුත් දෙවියන්වහන්සේ අද ඔබව උන්වහන්සේ වෙතට ගෙනෙන පිණිස සූදානමින් සිටී.

***''ස්වාමීන්වහන්සේ බිඳිණු සිත් ඇත්තන්ට ළංව සිටින සේක. තැළුණු ආත්ම ඇත්තන් ගළවනසේක.'' (ගීතාවලිය 34:18)***



***'උන්වහන්සේ බිඳුණු සිත් ඇත්තන් සුවකරන සේක, ඔවුන්ගේ තුවාල බඳිනසේක.'' (ගීතාවලිය 147:3)***

***''.....මට උසස්වූ ශුද්ධවූ ස්ථානයෙහිද යටහතුන්ගේ ආත්මය ප්‍රාණවත් කරන්ටත් පොඩි වී සිටින්නන්ගේ සිත ප්‍රමාණවත් කරන්ටත් තැළුණාවූ යටහත් ආත්මයක් ඇත්තා සමග වාසයකරමි.'' (යෙසායා 57: 15)***

ඔබගේ ජීවිතයෙහි අලුත් දෙයක් ගොඩනැගීමට නම්, ඔබගේ කැඩුනාවූ බිඳුණාවූ ජීවිතය උන්වහන්සේට අවශ්‍යව ඇත.

ඔබගේ ජීවිතයෙහි ඔබ පාපයෙන්, නපුරු පුරුදුවලින්, ලෙඩ රෝග වලින්, ආර්ථික අමාරුකම් වලින් හා පරම්පරාගත ශාප ආදී දේ වලින් යට වීසිරවී සිටින්නට පුළුවනි. නමුත් දෙවියන්වහන්සේ ඔබට ප්‍රේම කරන නිසා ඔබව මේ තුළින් නිදහස් කරමින් නැවත උන්වහන්සේ වෙතට ගෙනෙන පිණිස බලා ගෙන සිටී. ''මා දෙවියන්වහන්සේගෙන් ඈත් වී සිටිනවා'' ය කියා ඔබ සිතනවා නම්, ස්වාමීන්වහන්සේ ඔබට පවසන්නාවූ වදන් නම්, ''ඔබ මට අවශ්‍ය නිසා නුඹ මා වෙතට එන්න'' කියාය.



....Contd. to page 10


# RESIDENTIAL BIBLE COURSE
NEHEMIAH BIBLE COLLEGE, Chennai.

Pray for

Rush for Admission!

★ ONLINE CLASSES ARE AVAILABLE ★

Medium : Hindi/Tamil

Recognised by International Christian Leaders & Senior Pastors for the past 54 years

Certificate in Ministry
Diploma in Theology

Qualification : 10th Standard & above

Contact : The Chairman, Nehemiah Bible College.

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

“...කියවන්නා තේරුම් ගනීවා....” (මතෙව් 24:15)

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ - හාස්කමේ දෙවියන්වහන්සේයි!

'යමෙක් මට සේවය කෙරේ නම්... ඔහුට මාගේ පියාණෝ ගෞරව කරන සේක.'' (යොහාන් 12:26)

මගේ ජීවිතයෙහි විවිධ අවස්ථාවන් වලදී දෙවියන්වහන්සේ මා හට මහත් වූ දේවල් කලේය. උන්වහන්සේ බොහෝ හාස්කම් හා ආශ්චර්ව මත් දේ කරමින් මාව උන්වහන්සේ ගෞරවයට පත් කලේය. මගේ සේවයටත් අපගේ සේවා මූලස්ථානයටත් පිට පලාත්වල කරගෙන යන්නාවූ සේවයටත්, සියල්ලේදී උන්වහන්සේගේ පුදුම වූ හාස්කම් මා අත්දැක්කෙමි. ස්වාමීන්වහන්සේගේ නාමයට ගෞරවය වේවා.

වරක් මා ඕස්ට්‍රේලියා දේශයේ සිඩ්නි, මෙල්බන් හා බ්‍රිස්බන් යන නුවර වල සේවය කලෙමි. එහිදී බොහෝ දෙනෙක් අපගේ දෙවියන්වහන්සේගේ බලවත් හස්තය අත් දුටුවේය.

එහිදී දිනක් ඕස්ට්‍රේලියානු යුවලක් මා සිටි නිවසට මාව බැලීමට ආවේය. ඔවුන් කඳුළු සමඟ මා හට පැවසුවේ, අප විවාහ වී වසර 13 කි. නමුත් අපට තවමත් දරූ සම්පතක් නොමැති නිසා අප දෙදෙනාම සමාදානයෙන් දික්කසාද වීමට යනවාය කියාය. එම රටෙහි දික්කසාදවීම ඉතාම සාමාන්‍ය වූ දෙයකි. එම යුවළ ඒ වෙනුවෙන් මා හට යාච්ඤා කරන්නය කියා පැවසුවේය.

මා ඉතා දුකට පත් වී දෙවියන්වහන්සේ ඔබ දෙපලට දරුවෙක් දෙන්න කියා මා යාච්ඤා කරන්නට කියා ඔවුන්ගෙන් ඇසුවෙමි. ඔවුන් සිනාසී අප ඉතා ප්‍රසිද්ධ වෛද්‍යවරුන් වෙතට ගියා නමුත් ඔවුන්ට අප උදෙසා කිසි දෙයක් කිරීමට බැරි විය. එම නිසා ''යාච්ඤාවෙන් දරුවෙක් ලැබෙන්නේ කොහොමද?'' ඇසුවේය. මා ඔවුන් සමඟ වාඩි වී ඇදහිල්ල ගැන හා දෙවියන්වහන්සේගේ බලය ගැන ඔවුන්ට පැහැදිලිකර දුන්නෙමි. පසුව මා ඔවුන් සමඟ යාච්ඤා කලෙමි.



*God granted three children and blessed them.*

දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා ! මාස දෙකකට පසුව ඕස්ට්‍රේලියාවේ මා නැවත ඉන්දියාවට පැමිණෙන පිණිස ගුවන් තොටුපල වෙතට පැමිණි විටදී ලොකු තෑගි පාසර්ලයක්ද අතැතිව යුවලක් මා

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press - Publications
11. St. Paul's Matriculation School - Village English High School
12. Sunday Schools : 10.30 a.m. & 4.00 p.m. Sunday
13. **Early Morning Service : 5.30 a.m. Sunday**
14. **Tamil Service : 8.30 a.m. Sunday**
15. **Youth Service : 11.00 a.m. Sunday**
16. **Fellowship Lunch : 12.30 p.m. Sunday**
17. **Travel to Mission Centres : 1.30 p.m. Sunday**
18. **Children Ministry : 3.00 p.m. Sunday**
19. **Hindi Service : 4.00 p.m. Sunday**
20. **Telugu Service : 5.00 p.m. Sunday**
21. **Telugu, Hindi & Telugu Service : 6.00 p.m. Sunday**
22. Women's Prayer : 5.30 p.m. Wednesday
23. Men's Prayer : 7.00 p.m. Friday
24. Discipleship Meeting : 6.00 p.m. Saturday
25. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
26. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
27. Ministers' Meeting : 6.00 p.m. First Saturday
28. Parents' Prayer : 4.00 p.m. First Sunday
29. Night Prayer : 9.30 p.m. Third Friday
30. Fasting Prayer : 9:30 a.m. Second Saturday
31. Holy Communion : Second Sunday Services
32. Youth / Kid Prayer : 10.00 p.m. daily
33. Staff Devotion : 9.00 a.m. daily
34. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

අසලට පැමිණෙන බව මා දුටුවෙමි. ඔවුන් විනාඩි දහයක් පමණ ඔවුන් මගේ අත අල්ලාගෙන ඇඬුවේය. මා මහත් විමතියට පත් වූ අතර එහි සිටියාවූ සියලු දෙනාම අප දෙස දෙනෙත් හෙලාගෙන සිටියෝය.

අවසානයේදී එම ස්වාමි පුරුෂයා කථා කරමින් මගේ බිරිඳ මේ වන විට ගර්භණීයව සිටින බවත් වෛද්‍යවරුන් එය ස්ථිරව කලේය, කියාත් පවසනු ලැබීය. ඔවුන් තෑගි පෙට්ටියෙහි, මට අවශ්‍ය ඇඳුම්, හා සේවයට අවශ්‍ය වන්නාවූ දේවල්ද තිබුණි. දෙවියන්වහන්සේ ඔවුන්ට දියණියක් දෙමින් ආශිර්වාද කලේය. ඉන් පසුව දෙවියන්වහන්සේ ඔවුන්ට තවත් පුත්‍රයින් දෙදෙනෙක්ද දී ආශිර්වාද කලේය.

ප්‍රිය මිත්‍රවරුනි, දෙවියන්වහන්සේට මෙවැනිම වූ හාස්කම් ඔබගේ ජීවිතයෙහි කිරීමට පුළුවනි. ස්වාමීන්වහන්සේව විශ්වාස කරමින් යාච්ඤා කරන්න. ස්වාමීන්වහන්සේ ඔබගේ ජීවිතයෙහිද හාස්කම් ඉටු කරයි.

මා දේශනා කරන්නාවූ, සේවය කරන්නාවූ මාගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දරුවැන් නොමැති වූ යුවලට දරු සම්පත් ලබා දෙන්නට පුළුවන් විය. රෝගීව සිටින්නාවූ අයව සුව කරමින් අනෙකුත් සියලුම ආශිර්වාද වලින් පිරවීමට හැකිය. යේසුස් වහන්සේ ඊයෙන් අදත් හෙටත් සදාකාලයටම ඒකාකාරයි.

*******

RNI NO. TN/SIH/2006/17846

**Echo of His Call**

**YouTube**
Please subscribe

Kindly view and subscribe our **Echo of His Call YouTube Channel** when you get time. Thanks. **- Editor**

*....Contd. from page 7*

ඔබගේ අතීතය ගැන දෙවියන්වහන්සේට ප්‍රශ්නයක් නැත. රාහබ්, මතෙව්, සාකේවුස් යන මේ සියලු දෙනාටම ඉතා අසීරු වූ අතීතයක් තිබුණ නමුත් එම අතීතයේ සිදු වූ කාරණාවන් ඔවුන්ගේ අනාගතයට බලපෑවේ නැත. දෙවියන්වහන්සේට ඔබව අවශ්‍යයි. ඔබ උන්වහන්සේ වෙතට ගොස් නිදහස ලබා ගැනීමට අවශ්‍යයි. ඔබ උන්වහන්සේ වෙතට ගොස් නිදහස ලබා ගැනීමට කැමතිද?

බොහෝ දෙනෙක් අද මාර්ග දෙකකට හිරවී සිටී. ඔබගේ මනස එක්තැන් කරගන්න. ඔබගේ ජීවිතයේ දෙවියන්වහන්සේට භාර කරන්න.

ඔබ දෙවියන්වහන්සේට භාර වීමට අකමැති නම්, තව දුරටත් දෙවියන්වහන්සේ ඔබට ඒ සඳහා බල කරන්නේ නැත. නමුත් ඔබගේ ජීවිතය අනතුරු දායකය. මතක තබාගන්න. ස්වාමීන්වහන්සේ මා ඔබව අවශ්‍යයි !

*******

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps **(Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.)** to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :
**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 3rd JUNE 2024.

**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
P.O. Box No. 2957,
Chepauk, Chennai - 600 005, INDIA.
Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**